# මංමුළා වූ ජ්‍යොතිෂයක අනාගතය

ආචාර්ය පියසේන රතුවිතාන

බන්ධනාගාරගත වූ හෝ පිළිකා වැනි බියකරු රෝග වලට භාජන වූ සිය ගණනකගේ කේන්ද්‍රවල පිහිටි, එකී තත්ත්වය මතු කිරීමට හේතු වූ ග්‍රහ පිහිටීම් මොනවා දැයි විමසා බැලීමට මම කාලයක් මිඩංගු කෙළෙමි. එදා වරාහමිහිර ආචාරීන් විසින් ඒ පිළිබඳව යම් සිද්ධාන්තයක් දුන්නේ නම් එය අකුරටම නිවැරැදි බව අපට පෙනී ගියේය.

ජ්‍යොතිෂය මැනැවින් ඉගෙනීමට නම් ඒ හා බැඳුණු ශ්ලෝක ලක්ෂයකට ටිකක් වැඩි ගණනක් වන පොත් කළ යුතුය. නැත්නම් අර්ථාවබෝධ කර ගත යුතුය. ඒ සඳහා කෙනකුට මුළු ජීවිත කාලයම යෙදුවත් එයින් කොටසක්වත් ග්‍රහණය කළ නොහැකිය.

පාසල් අධ්‍යාපනය සඳහා වයස 20 ක් වන තුරුවත් අත්හලොත්, විවාහ කටයුතු, රැකියා කටයුතු ආදී දහසක් පමණ කටයුතු සඳහා තවත් වසර විස්සක් විසිපහක් වෙන් කළොත් වසර 80 ක් පමණ ජීවත් වන කෙනකුට ජ්‍යොතිෂය වැනි ගුප්ත, ගැඹුරු ශාස්ත්‍රයක් ඉගෙනීමට ඉතිරිව ඇත්තේ වර්ෂ කෙටි කාලයකි. එකී කෙටි කාලය තුළ ජ්‍යොතිෂයට අයත් ශ්ලෝක ලක්ෂ සංඛ්‍යාවකින් දැක්වෙන අරුත ග්‍රහණය කළ නොහැකිය.

එහෙත් මේ රටේ හයමාසයක් වැනි අංශු මාත්‍ර කාලයක් තුළදී (ජ්‍යොතිෂ පන්තිවලින්) ජ්‍යොතිෂඥයෝ දහස් ගණනක් පිටවෙති. එසේ පිටවන්නෝ සුළුපටු අය නොවෙති. ආධ්‍යාත්මවේදී, ජ්‍යොතිෂ ගවේෂක ජ්‍යොතිෂ විශාරද, ජ්‍යොතිෂ ප්‍රවීණ වැනි බරපතළ හනිවරයක් ද සහිතවය. මේ හැම කෙනෙක්ම ජ්‍යොතිෂ ගංගාවේ තොටුපළ අද්දරට පමණක් ගිය අය වෙති. එහෙයින් ජ්‍යොතිෂ දැනුම පිළිබඳ රජයේ ප්‍රමිති සහතිකයක් නැති නිසා කවුරුත් ජ්‍යොතිෂඥයෝ ය. විශාරදයෝ ය. ප්‍රවීණයෝ ය. ප්‍රසිද්ධ පුවත්පතකට හෝ මාසික සංග්‍රහයකට සාර්ථක ජ්‍යොතිෂ ලිපියක් ලබා ගැනීම දුෂ්කර කටයුත්තක්ව ඇති බව හැම කතුවරයෙක්ම දනිති.

මේ වන විට ජ්‍යොතිෂ පන්තිවලින් නොව ගුරු ඇසුරින් ජ්‍යොතිෂය තරමක් දුරට හෝ අධ්‍යයනය කරන ලද දහපහළොසක් පමණ වූ වයෝවෘද්ධ සුළු පිරිසක් අප අතර වෙති. ඒ අයගේ හස්තසාර දැනුම ලබා ගැනීමට රට අපොහොසත් වුවොත් ඉතා වටිනා ජ්‍යොතිෂ ශ්‍රාස්ත්‍රය නැත්තටම නැති වී යයි.

ජ්‍යොතිෂයට අත්වැලක් විශ්ව විද්‍යාලයකින් හෝ වෙනත් අධ්‍යාපන පීඨයකින් සපයන්නේ නැති නිසා මූලික ජ්‍යොතිෂ දැනුම හෝ ලබා දීමට වෙහෙසෙන ජ්‍යොතිෂ පන්ති ගුරුවරුනට පැසසිය යුතුය. ප්‍රශංසාව අහිමි වන්නේ දැනුම එහෙන් මෙහෙන් තවරා ගෙන මාස කිහිපයකින් ජ්‍යොතිෂවේදීන් වශයෙන් පෙනී සිටින පිරිසටය.

මා පසුපස එන්නැයි පැරැණි ගුරුවරයා සිය ශිෂ්‍යයනට කීවේය. නැත මා පසුකර යන්නැයි වත්මන් ජ්‍යොතිෂ ගුරුවරයා සිය ශිෂ්‍ය පරපුරට කියයි. එසේ ගුරුවරයා පසුකර යන්නට නම් යටත් පිරිසෙයින් වසර 20 ක් වත් හොඳ ගුරුවරයකු යටතේ ජ්‍යොතිෂය හදාළ යුතුය. අප්‍රමාණ වූ පොත් අතරින් හැකිතාක් කියවා නව දැනුම සපුරා ගත යුතුය. එසේ වෙතොත් වසරකට ජ්‍යොතිෂවේදීන් හතරපස් දෙනකුවත් බිහිවනු නියති. වරක් විදෙස්ගතව සිට මාස කීපයක නිවා-ඩුවක් සඳහා මෙරටට පැමිණි කෙනෙක් අප හමු වී මෙබඳු ආයාචනයක් කළහ.

මම ඔබතුමාට රුපියල් දහස් ගණනක් ප්‍රමාණවත් නොවේ නම් ලක්ෂයක් වුවත් ගෙවන්නම්. මට මාසයක් තුළදී ඔය ජ්‍යොතිෂ ශාස්ත්‍රය උගන්වන්න බැරිද? ඉතිරි දැනුම මම පත පොත කියවා ලබා ගන්නම්.

එක මාසයකින් එක ග්‍රහයකු පිළිබඳ පැතිරී ගිය ශක්තිය ගැන උගන්වන්න නම් පුළුවන් වෙයි. සාමාන්‍ය දැනුමක් ලබා ගැනීම සඳහා නම් වසර දෙක තුනක් නැතිව බැරි බව මම කීමි.

ඔහුගේ අභිප්‍රාය වූයේ ජ්‍යොතිෂ දැනුම තෙම්පරාදු වශයෙන් දැන ගෙන විදෙස් රටක ජනතාවට ජ්‍යොතිෂවේදියකු වශයෙන් පෙනී සිටීමය. ඔහුගේ ඉල්ලීම අපෙන් ඉටු නොවුනත් වෙනත් කෙනකුගෙන් ඉටු කර ගන්නට ඇතැයි සිතමි.

හිටපු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතාගේ බලවා ගැනීමට නයිදු නමැති ජ්‍යොතිර්වේදියා එදිරිසිංහ මහතා මගින් කැඳවා ගත හැකි විය. මම ද එවකට ආධුනිකයකු වශයෙන් ඒ අය සමගජ්එහි ගියෙමි.

හොඳට සැරසී එකම ශාලාවක මැණික් ව්‍යාපාරික පිරිසකුත් ඒ අයගේ පවුලේ අයත් එහි වූහ. ඒ අය පළමුවෙන් ම එක් අයකුගේ හඳහනක් නයිදු අතට පත් කළේය.

හෙතෙම හඳහන දිග හැර උපන් දිනය ගෙන පංචාංග ලිතක් පෙරළා (ඔහුට සිංහල බැරි නිසා) අලුතින් හඳහන නිර්මාණය කර, පිරිස දෙස බලා මේ හඳහන අයිති පුද්ගලයා මේ පිරිස අතර සිටින බවක් නොපෙනෙන බව කීය.

මේ ඉන්නේ ඔය හඳහන අයිතිකාරයා බව ව්‍යාපාරිකයෝ කීහ.

එහෙනම් මේ හඳහන වැරදි ඇති. මන්ද මේ හඳහන ගස් නගින, වත්ත පිටිය උදලුගාන, අනුන් යටතේ වැඩ කරන කම්කරුවකු වැනි කෙනකුගේ යෑයි නයිදු ජ්‍යොතිෂවේදියා කීය.

මැණික් ව්‍යාපාරිකයන් කළේ ඔවුන් සමග සිටි සේ-වකයකු ව්‍යාපාරික බලවතකු සේ ඉදිරිපත් කර ජ්‍යොතිෂවේදියාගේ දැනුම පරීක්ෂා කිරීමේ



උපායකි. එතැන සිට එදින රෑ බෝ වන තුරුම බොහෝ පිරිසකගේ හඳහන් නයිදු ලවා බලවා ගන්නට ඔවුහු උනන්දු වූහ.

ඒ නිර්දේශය මා ඉදිරිපත් කළේ හඳහනක් තුළ කිසියම් රාශියක පතිත ග්‍රහයකුගේ ග්‍රහ බලය, නැකැත් බලය, දෘෂ්ටි බලය, සංයෝග බලය, ආපෝ තේජෝ ආදී පංච මහා භූත බලය, දෙර්කාණ අයිතිය, ආරූඪ ශක්තිය, ආදී අප්‍රමාණ සිද්ධාන්ත හරහා කේන්ද්‍රය බලා පුද්ගලයා කෙබඳු කෙනකු දැයි හඳුනාගෙන පලාඵල කීමය.

හඳහන බැලුවේ නයිදු නමැති ද්‍රවිඩ ජාතිකයෙකි. උසින් මහතින් වැඩුණු එක් කණක කරාබුවක් දමා ගෙන උත්තර සාටකයක් ද සහිත ඇඳුමකින් සැරසී සිටි හෙතෙම කායික වශයෙන් එළාර රජු වැනි කෙනෙකි. දැනුමෙන් අග්‍රගන්‍ය ජ්‍යොතිෂවේදියෙකි. මා ඒ මහතා හඳුනාගත්තේ ගායක සුනිල් එදිරිසිංහගේ වැඩිමහලු සහෝදර එදිරිසිංහ මහතා නිසා ය.

රත්නපුරයේ මැණික් ව්‍යාපාරික දහ පහළොස්දෙනකුගේ ඉල්ලීම පරිදි ඔවුන්ගේ හඳහන

විශේෂයෙන් ම වෘත්තීය බලය පැවැසීම සඳහා ජන්ම කේන්ද්‍රයේ සැගවුණු ධන ශක්තියත්, කර්ම පාලන ග්‍රහයන් දෙදෙනාගේ තත්ත්වයත්, දශාංශක කේන්ද්‍රයේ දහ වැන්නාධිපතිත් අවධානයට ලක් කළ යුතු බව මම නයිදු ඇදුරුගෙන් එදා උගතිමි.




සෙනසුරා තුලා රාශිගත වුණෝය යි හෝ ගුරු කටක රාශිගත වුණෝ ය යි කීමෙන් ජ්‍යොතිෂය ටිකක් හෝ දන්නා කෙනකුට යමක් කිව හැකි වෙතත් තවත් ගැඹුරට කිමිදී බොහෝ අනාවැකි කිව හැක්කේ ඒ විෂය ගැඹුරට හදාළ කෙනකුට පමණි. ඒ ශක්තිය ඇති අය අතීතයේ වූහ. අදත් නැත්තේ නොවේ. එහෙත් ඒ අය අප්‍රසිද්ධියේ නිහඬව සිටිති. ලේඛන කලාව හෝ වාග් ශක්තිය නැති හෙයින් සැගවී, දන්නා දැනුමෙන් ප්‍රයෝජනය ගන්නවා විය හැකිය.

මගේ තරුණ අවදියේදී (මෙයට වසර 50 කට පමණ පෙර) තවත් වැඩිහිටියකු සමග මම කහතුඩුව පැත්තේ දක්ෂ ප්‍රකට ජ්‍යොතිෂ්‍යවේදියකු හමුවීමට ගියෙමි. ඒ ගියේ අවශ්‍යතාවක් සඳහා තත්කාල නිමිත්තක් බලා ගැනීමටය.

ජ්‍යොතිෂවේදියා තත්කාල කේන්ද්‍රයක් ගොඩනගා අප පැමිණි ගමන් මග ද, ඉදිරියට හමු වූ අය ගැන ද පවසා මේ තත් කාලය අහන්නේ ඉඩමක බිමක් ගැනය. එතැන ලොකු කළුගලක් හා ගැට ගැට සහිත පූජනීය වෘක්ෂයක් ද ඇති බවත් තමා විමසන්නේ ඒ ගස (එය නුග ගසක් විය හැකිය) කපා දමා එතැන ගොඩනැගිල්ලක් හදන්න හොඳ ද යන ප්‍රශ්නය බවත් කීය. මගේ වැඩිහිටි ඥාතියාගේ අරමුණ ද එයම විය. තත්කාල කේන්ද්‍රයෙන් ඒ තත්ත්වය පැවැසීමට හෙතෙම ධාතු * මූල, ජීව යන පිහිටීමත්, ආපෝ, තෝජෝ ආදී පංච මහා භූත ශක්තියත් තත්කාල කේන්ද්‍රයේ 4 වැනි රාශිය ප්‍රමුඛ 7 සහ ලග්නය උපයෝගී කර ගත් අයුරු මම අද මනසින් දකිමි.

නිදසුන් දෙකක්ම ඉදිරිපත් කළේ ජ්‍යොතිෂය යනු මහත් පුදුම තොරතුරු අනාවරණය කළ හැකි ගුප්ත ශාස්ත්‍රයක් බව පෙන්වා දීම සඳහාය.

ලිපිය දීර්ඝ වෙතත් මෙයට වසර දෙක තුනකට

35 වන පිටට


## රෝද පුටුවක් විකිණීමට

Thomastown VIC

දින තුනක් පමණක් පාවිච්චි කළ
අලුත්ම රෝද පුටුව විකිණීමට තිබේ
ඩොලර් 125

විමසන්න
0433 438 535



## FOR SALE

Well established Sri Lankan grocery and take away shop in Deer Park. Attached to three bedroom house with low rent, long lease and lots of parking space. Selling due to owner's poor health.

For enquiries contact:
0434245081
(03) 83904212